# ශ්‍රී ලංකාවේ ස්වාභාවික නා කැළෑ

පැරණි ලංකාවේ වනාන්තර ආරක්‍ෂාව ඉතා දැඩි ලෙස ක්‍රියාත්මක විය. කැළෑ එලි කිරීම පරිසරයටත් ආරක්‍ෂාවටත් තර්ජනයක් වූ බැවින්, රටේ බොහෝ ප්‍රදේශවල "තහංචි කැළෑ" හෙවත් තහනම් කැළෑ වලට නීතිමය ආරක්‍ෂාව විය. ඉන් සමහර වනාන්තර පලතුරු හෝ ඖෂධ කැළෑ විය. ඉන් ලංකාවේ එදා තිබී දැනට විනාශව ගිය හා තවම තරමක් දුර ඉතිරිව ඇති ස්වාභාවික නා කැළෑ ගැන සටහනක් මෙහි එයි. එදා බෝගස මෙන්ම නාගස පූජනීය ස්ථානවල වැවුණි. නාගස පෙර බුදුවරුන් පිටදුන් ගසකි. එමෙන්ම නාගස දේව ආකර්ෂණය කරයි. දළු තද රතු පාටය. විසිතුරුය. මල් සුවඳ වගුරයි. ඒ මී මැසි ආහාරයක් නාමල් රේණු ඖෂධයකි. පොසොන් මස නාමල් පිපෙයි. දිය නා, බටු නා යන නා විශේෂ දෙකක් ඇත. ඒ විශේෂ දෙකම ආයුර්වේද ඖෂධ ලෙස භාවිතා වෙයි. ඒ අනුව නාගස වනය රකින පූජනීය අලංකාර මල් පිපෙන ඖෂධීය ශාඛ වෙයි. නාමල් පිපෙන කාලයට නා කැළෑයට සුදු පාට මල් පෙති වැටී නාගස් මී මැස්සක් ගෙන් පිරී අමුතුම ලෝකයක් මවයි. පැරණි ලංකාවේ වූ ස්වාභාවික නා කැළෑ කිහිපයක් ගැන කෙටි සටහනක් මෙහි එයි.

1. මහා වංශය අනුව බුදු හිමි පළමු වරට ලංකාවට වැඩි මහියංගනයේ මහා නාග වන උයන විය. මහියංගනය යක්ෂ ජනාවාසයක් විය. මහා නාග උයන ඒ නම අනුව ස්වාභාවික නා උයනකි.

2. මහියංගනය, දඹාන වැදි ගම්මානය අවට කැලේ මිනිසුන් දහ දෙනුකුට බැදිය නොහැක තරම් මහත ඉපැරණි නාගස් මෑතක් වනතුරු තිබූ බව දඹාන වැදි නායක තිසාහාමි කියා ඇත.

3. නුවරගල සිට කිරිඹය දෙසට පාර දෙපැත්තේ වූ නා කැලේ නම්වූ නා වනය දැන් වැනසී ගොසිනි.

4. පාරු කවි වල කැළණි ගග දෙපස වූ සරුවට වැඩුනු නාගස් ගැන කියවෙයි. අධික ලෙස ජනාවාස වීම නිසා කැළණි ගං ඉවුරේ නාගස් විනාශ විය. අද කැළණි ගං ඉවුරේ නාගස් දැකිය හැක්කේ කලාතුරකිනි.


**එස්.කේ. ජයවර්ධන**

වත්තේගම හිටපු කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ

සොමි කැළුම්, නාපාන, ගුන්නෑපාන.


5. පලාගල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය අයත් ගල් හිරියාගම නාමල් උයන දැනට ලංකාවේ ඇති විශාලම නා උයන හා රෝස තිරිවාන නිධිය ඇත. මෙහි නා වනය අක්කර දෙසිය හැටක් විශාලය. ජන ප්‍රවාද අනුව මෙම නාමල් උයන බුද්ධදාස රජු පිහිටවූ ඖෂධීය නා උයනකි. එය අනුරාධපුර කල සිටම අභය භූමියකි.

මෙහි සමහර නාගස් අවුරුදු 600-1000 තරම් පැරණිය. දිය නා හා බටු නා යන නා වර්ග දෙකම මෙහි ඇත. නා වර්ග දෙක හැර වෙනත් වෘක්ෂ විශේෂ 82 හා ඖෂධ ශාඛ විශේෂ 78 ලංකාවේ ඇති එකම රෝස තිරිවාන නිධිය මෙම නාමල් උයන යාව ඉහළ කන්දේ ඇත. මෑත කල රෝස තිරිවාන නිධිය ආශ්‍රිතව අක්කර 20 පමණ විශාල ප්‍රදේශයක ඉපැරණි ශාක පොසිල නිධියක් හමුවී ඇත. රෝස තිරිවාන නිධිය ඉහළ කෙටි කඳු මුදුන් හතක් ඇති කඳු ගැටයකි. ජල උල්පත් රැසක් තිරිවාන නිධිය හා නා කැළෑව මැදින් ගලා බසී.

6. සිංහරාජය යාව ඇති සිංහරාජයේ උප වනාන්තරයක් වූ ඉපැරණි "නාහිටිය" වන රක්ෂිතයට ඒ නම ලැබී ඇත්තේ නා හිටිය රක්ෂිතයේ නාගස් බහුල බැවිනි.

7. ලෝක උරුමයක්වූ සිංහරාජ කැළෑව තුළ එක් වන අඩවියක් "නා මන්ඩිය" ලෙස හඳුන්වයි. නා මන්ඩිය හා නාගස් බහුල සිංහරාජයට අයත් අඩවියකි.

8. ගලේවෙල සිට කලා වැවට යන පාරේ සැතපුම් 4 ක් ගියවිට දේවහුව අසල "ගොම්මොට්ටාව කන්ද" (ගෝසිසපබ්බත) ලෙස හඳුන්වයි. කඳු මුදුන ගොනෙකුගේ මොල්ලියක් ලෙස පිහිටා ඇති නිසා එම නම ලැබී ඇත. එය කටාරම් කෙටු ගල්ලෙන් රැසකින් යුත් පැරණි බෞද්ධ ආරණ්‍යයකි. මෙම කඳු ගැටයේ ඉහළ කොටස අදත් මුළුමනින් නා ගස් වලින් වැසී ගිය කැළෑවකි. අතීතයේ මෙයට වඩා විශාල බිමක නා කැළය තිබී ඇත.

9. බකමූණ ට්‍රැක් 6 ප්‍රදේශයේ අඹන්ගගේ ජලයට යටවෙන "නාකැලේ" නම් නා උයන ඇත. එය අඹන් ගගේ ජලයට නිතර යටවෙන අක්කර අටක් තරම් විශාල නා කැළෑවකි.

10. නාවලපිටිය සිට පැලැම් පිටියට යන පාරේ යටියන්තොටට අයිති "නාගස්තැන්න" වන රක්ෂිතය ඇත. "නාගස්තැන්න" නාගස් බහුල රක්ෂිතයකි.

11. ආනමඩුව "නා කැළේ" වන රක්ෂිතය ඇත.

12. ඕපනායක "නා කැටිය" වනාන්තරය ඇත.

13. කුරුණෑගල "නාගොල්ල" රජ මහා විහාරයේ අදත් ඉදිරිපස නාගස් බහුලය. එද, මීට වඩා එහි නාගස් ඇත.

14. නාලන්ද, නාඋල, නාගල කන්ද, නාගස්තැන්න යන ස්ථාන නාම නා කැළෑ නිසා ලැබී ඇත. නාගස් අතර ඇති උල්පත් නිසා "නාඋල" නම සැදී ඇත. අදත් එහි දිය උල්පත් ගණනාවකි. නාඋල උල්පත් මාතලේ උමං ගගෙන් මතුවෙන බව විශ්වාසයයි. "නාලන්ද" යන්නෙහි අර්ථය නා කැළෑව යනුයි.

15. මහනුවර උඩවත්ත කැළේ අතීතයේ සිටම රජුන්ට සීමා වූ තහංචි කැළෑවකි. උඩවත්ත කැළේ එක් වන අඩවියක් "නා කැලේ නම වෙයි. "නා

කැලේට" ඒ නම ලැබුනේ නාගස් බහුල බැවිනි.

16. පිළිමතලාවේ යටිනුවරට අයත් දෙඩම්වෙල දේවාලය වඩාත් ප්‍රකට වුයේ දෙවැනි රාජසිංහ රජු (1636-1687) කලය. මේ රජු ගන්නොරුව සටනට පෙර දෙඩම්වෙල දේවාලයට බාරවී සටන දිනා රජු තම දේලාව රන් ඔටුන්න හා රන් කඩුව දෙඩම්වෙල දේවාලයට පුජා කර ඇත. දෙවැනි රාජසිංහ රජු දෙඩම්වෙල සිට එම දේවාලයේ පෙරහැර දිය කැපීමට එන ගැටඹේ තොට දක්වා මග දෙපස නාගස් වවා ඇත. එද මේ අනුව දෙඩම්වෙල සිට ගැටඹේ දක්වා සැතපුම් තුනක් දක්වා දුරට නා කැළැව විය. ජනාවාස වීම නිසා මේ නැ කැළේ විනාශ වී අඳත් දෙඩම්වල දේවාලය අවට කට්ටි කට්ටි ලෙස පැරණි නාගස් සියයකට වඩා දේවාලය වටා ඉතිරිව ඇත.

17. නවගමුව පත්තිනි දේවාල බිමේ ගොඩනැගිලි වටා හා ගොඩනැගිලි වල වහල මැදින් ඉහල ඇදි ඇති නාගස් අමුතු භක්තියක් හා ගුප්ත බවක් හිතට මතු කරයි. ගොඩනැගිලි වල වහල මැදින් ඉහළට ඇඳුණු නාගස් හා දේවාලය වටා විහිදුණු නාගස් නවගමුව පත්තිනි දේවාලයට අමුතු හැඟීමක් එකතු කරයි.

18. වස්ගමුව වන උයනේ "නාවදුල මැද නාගහ උල්පත ඇත.

| | |
|---|---|
| ගසට කෙටුම ගස මුල පැයුමෙන් | දැනේ |
| හානා හිය පානා අඬ හැරෙන් | දැනේ |
| මිනිහා නොමිනිහා එන කඩිනමින් | දැනේ |
| අමුතු බත් දීම අත ඇල්ලුමෙන් | දැනේ |